# කිරි රැස් කිරීම විධිමත් කළ විට ප්‍රශ්න විසඳෙනවා — කිරි මණ්ඩල සභාපති

**(ජාතික කිරි මණ්ඩලයේ සභාපති ඒ. පී. බී. මනම්පේරි මහතා සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවක් අනුසාරයෙනි)**

**ප්‍රශ්නය:** ජාතික කිරි මණ්ඩලයේ සභාපති වශයෙන් දිවයිනෙහි කිරි නිෂ්පාදනය පිළිබඳ ඔබගේ අදහස් මොනවා ද?

**උත්තරය:** මෙරට කිරි පට්ටි පාලනය දැන් සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින නිසා කිරි නිෂ්පාදනය ද වැඩි වී ඇති බව පැවසීමට හැකි වීම සතුටට කරුණකි.

(මෑතක් වන තෙක් කිරි පට්ටි පාලනයේ ව්‍යාප්ති කටයුතු කිරි මණ්ඩලය වෙත පැවතියේය. එහෙත් දැන් මෙම කාර්යය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කර ගෙන යනු ලබන අතර, කිරි පට්ටිකරුවනට උපදෙස් දී ආධාර කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශිල්පීය ඒකකයක් පිහිටුවා ඇත. ලංකාවේ කිරි පට්ටි සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන බැංකුව දැන් ආධාර සපයයි.)

**ප්‍රශ්නය:** කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිරි මණ්ඩලය විසින් කිරි පට්ටිකරුවන්ට දෙන අනුබල මොනවා ද?

**උත්තරය:** ප්‍රධාන වශයෙන් කිරි මණ්ඩලය විසින් කිරි පට්ටිකරුවන්ට දෙනු ලබන ආධාරය මිළ හා සම්බන්ධව පවතී. පෞද්ගලික අංශය කිරි පයින්ට් එක්කට අඩු මිළක් ගෙවන අතර, මණ්ඩලය විසින් එක කිරි පයින්ට් එකකට ශත 95 ක් ගෙවනු ලැබේ. මණ්ඩලය විසින් රැස් කරනු ලබන කිරි ප්‍රමාණය වැඩි වීමට හේතු වූ එක් සාධකයකි, මෙම මිළ. පසුගිය වසරේ දිනපතා අප රැස් කළ කිරි ප්‍රමාණය පයින්ට් 1,57,000 පමණ විය. එහෙත් මේ වසරේ එය ලක්ෂ තුනක්සේ වැඩි වී ඇත. කිරි නිෂ්පාදනය වැඩිවීමත්, නිපදවන්නන් වැඩි දෙනෙක් මණ්ඩලයේ මිළ ගණන් හා සැහීමකට පත් වී කිරි මණ්ඩලයට කිරි වැඩියෙන් විකිණීමත් මීට හේතු වූවා වන්නට පිළිවනි.

**ප්‍රශ්නය:** කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආධාර දීමට දැනට කිරි මණ්ඩලය විසින් කිසියම් පියවරක් ගෙන තිබේද?

**උත්තරය:** කිරි ප්‍රවාහණය පහසු කරවනු වස් කිරි දමන භාජන නිෂ්පාදකයින්ට සපයා දීමට මණ්ඩලය දැනට කටයුතු කරමින් සිටී.

(මණ්ඩලය විසින් ගෙන ඇති තවත් පියවරක් නම් කිරි පට්ටිකරුවන් සඳහා සමුපකාර සංවිධානය කිරීම යි. මෙවැනි සමුපකාර සංවිධානය කිරීමෙන් පසුව ඒවා කාර්යක්ෂම වූ විට වර්තමානයේ කිරි නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු බොහොමයක් මඟ හැරී යනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.)

**ප්‍රශ්නය:** කිරි නිෂ්පාදකයින්ට සේවාවන් සපයන සමුපකාර දැනට නැද්ද?

**උත්තරය:** මණ්ඩලයේ කිරි රැස් කරන නියෝජිතයින් වශයෙන් කටයුතු කරන සමුපකාර ඇතත්, ඒවා කිරි නිපදවන්නන් ගේ සමුපකාර වශයෙන් සැලකිය නොහැකි යි.

(කිරි නිපදවන්නන් ගේ සමුපකාර සමිති වලට කිරි නිපදවන්නන් පමණක් බඳවා ගනු ලබන, අතර, සාමාජිකයින් ගේ සියළු ම අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ඔවුන් කට යුතු කරනු ඇත.)

**ප්‍රශ්නය:** නිපදවන්නන් ගේ කිරි, මණ්ඩලයේ රැස් කරන්නන් වෙත සපයන අවස්ථා

වේ දී ඒවා හොඳ කිරි වශයෙන් පිළිගෙන පසුව මුදල් ගෙවීමේ දී නොයෙකුත් කරුණු නිසා ඇතැම් කිරි ප්‍රතික්ෂේප කර පයින්ට් ගණනක් අඩු කර ගනු ලබන බවට කිරි නිපද වන්නන් පැමිණිලි කරත්. මෙසේ ප්‍රතික්ෂේප කරනු ලබන කිරි අයිතිකරුවන් හට ආපසු භාර දෙනු නොලැබේ. මෙම තත්ත්වය සම් බන්ධයෙන් ඔබේ අදහස් මොනවා ද?

**උත්තරය**: මෙවැනි පැමිණිලි ගැන අපි දනිමු. ප්‍රතික්ෂේප කරනු ලබන කිරි වහාම ආපසු යවනු ලැබේ. කෙසේ වෙතත් කිරි නිපදවන්නන් ගේ සමුපකාර සමිති වඩ වඩාත් පිහිටුවීමෙන් පසුව මෙවැනි පැමිණිලි අඩුවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

**ප්‍රශ්නය**: කිරි ප්‍රතික්ෂේප කරන්නේ කවර හේතූන් නිසා ද?

**උත්තරය**: අයහපත් ස්වභාවයෙන් කිරි තබා ගැනීම, වතුර මිශ්‍ර කිරීම සහ මේද නොවන ඝන ද්‍රව්‍ය අඩු ප්‍රමාණයක් තිබීම ආදී හේතූන් නිසා ප්‍රධාන වශයෙන් කිරි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රශ්නය**: කිරි නිෂ්පාදකයින්ට තම කිරි ප්‍රමාණය කෙලින්ම මණ්ඩලයට විකිණීමට පුළුවන්ද?

**උත්තරය**: නිෂ්පාදකයා ඇතැම් සීමාවක් ඉක්මවා කිරි නිෂ්පාදනය කරන්නේ නම් නම් එසේ කිරීමට පුළුවනි. නිදසුනක් වශ වශයෙන්, උඩරට ප්‍රදේශයේ කිරි නිෂ්පාදක යෙක් මණ්ඩලයට කිරි විකිණීමට අදහස් කරන්නේ නම් දිනපතා කිරි පයින්ට් 75 ක් දීමට ඔහුට හැකි විය යුතු ය. මැදරට මෙම ප්‍රමාණය පයින්ට් 60 ක් වන අතර, පොල් ප්‍රදේශයේ හෝ වියළි කලාපයේ නම් පයින්ට් 40 ක් පමණ වන්නේය.

(කවර වූ හෝ පුද්ගලයෙක් කෙලින් ම කිරි මණ්ඩලයට කිරි සැපයුවත් තත් ප්‍රදේශයේ කිරි රැස් කිරීමේ නියෝජිතයකු වශයෙන් කටයුතු කරන සමුපකාරයට සෑම කිරි පයින්ට් එකකට ම ශත 02 ක කොමිස් මුදලක් නිරායාසයෙන් ම හිමි වන්නේය. ශත 02 ක මෙම කොමිස් මුදල පදනම් කර ගෙන තලව කැලේ ප්‍රදේශයේ එක් සමුපකාරයකට රුපියල් ලක්ෂයක් උපයා ගැනීමට හැකි වූ බව මෙහි දී ප්‍රකාශ කිරීම වැදගත් වනු ඇත.)

**ප්‍රශ්නය**: කිරි නිපදවන්නෙක් කෙලින් ම කිරි මණ්ඩලයට තම කිරි ප්‍රමාණය සැපයී මෙන් කිසියම් විශේෂ වාසියක් සැලසෙන්නේ ද?

**උත්තරය**: සපයන කිරි ප්‍රමාණයෙහි මේද නොවන ඝන ද්‍රව්‍ය වැඩි නම් එම කිරි සඳහා වැඩි මිළක් ලබා ගැනීමට ඔහුට හැකි වනු ඇත. මෙම කිරි ප්‍රමාණය ම කිරි රැස් කරන නියෝජිතයා විසින් සපයනු ලැබේ නම් එයට හිමි වන්නේ සාමාන්‍යයෙන් ගෙවනු ලබන මුදල යි.

**ප්‍රශ්නය**: කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන් අප ගේ පාඨකයින්ට පැවසීමට ඔබ අදහස් කරන වෙනත් වැදගත් කරුණු කිසිවක් තිබේද?

**උත්තරය**: කිරි පට්ටි පාලනය පිළිබඳ පුහුණුවීමේ පන්තියක්, ඒ ගැන සැළකිල්ලක් දක්වන්නවුන් සඳහා සති අන්තයේ දී පැවැත්වීමට කිරි මණ්ඩලය කටයුතු සලසා ඇත. මෙම පන්තිය සතියක් හැර සතියක් කොළඹ-දීත්, පේරාදෙණියේදීත් පැවැත් වෙයි. මේවාට සහභාගි වන සංඛ්‍යාව වැඩි වෙමින් පවතින අතර, මෙසේ කිරි පට්ටි සංවිධානය පිළිබඳ විද්‍යාත්මක ඥානයක් ලබාගැනීමට ඔවුනට හැකි වනු ඇත.

**බටර්**: දැනට කිරි මණ්ඩලය දිනපතා බටර් රාත්තල් 2,000 ක් පමණ නිෂ්පාදනය කරන අතර, ඉදිරි මාස කිහිපය තුළ මෙම ප්‍රමාණය රාත්තල් 8,000 තෙක් වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

කිරි මණ්ඩලයේ කිරිවල අඩංගු විය යුතු සාමාන්‍ය මේද ප්‍රමාණය 3.5 ක් සේ සලකන අතර, ඊට වැඩියෙන් ඇති ප්‍රමාණය බටර් සෑදීම සඳහා උපයෝගී කෙරේ.

**(18 වන පිටුව බලන්න)**

# කිරි රැස් කිරීම

**පිටි කිරි:** අවුරුදු තුනකට ඉහත දී අඹේවෙල කම්හලේ දිනකට පිටි කිරි නිෂ්පාදනය රාත්තල් 4,000 ක් පමණ වූ අතර, මේ සඳහා ගනු ලැබූ කිරි ප්‍රමාණය පයින්ට 6,000 ක් පමණ විය. දැන් කම්හලෙහි පිටි කිරි නිෂ්පාදනය සඳහා උපයෝගී කෙරෙන කිරි ප්‍රමාණය දිනකට පයින්ට ලක්ෂ 2 ක් පමණ වන අතර වාර්ෂික පිටි කිරි නිෂ්පාදනය රාත්තල් 13,00,000 පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ජාතික පරිභෝජන ප්‍රමාණයෙන් 73% ක් පමණ වන අතර, කම්හලේ ධාරිතාවෙන් 93% ක් පමණ වන්නේය.

**උකු කිරි:** අපගේ ඉලක්කය වනුයේ මසකට අවුන්ස 14 උකු කිරි ටින් දශ ලක්ෂ දෙකක් නිෂ්පාදනය කිරීම යි.